# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/143/2022 (PSC)

පී.ඒ.කිත්සිරි
අභියාචක
එදිරිව
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
වගඋත්තරකරු

දිනය :-2025.05.08

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ආර්.එල්.හෙට්ටිආරච්චි මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ශ්‍රීනාත් රූබසිංහ මහතා.

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා.**

## -නියෝගය-

අභියාචක පී.ඒ.කිත්සිරි යන අයටද පිටපතක් සහිතව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද 2022.01.07 දිනැති ලිපිය මගින් විනය දඬුවමක් ලෙස, අභියාචකගේ වැටුප් වර්ධක 05ක් විලම්භනය කිරීමට නියෝග කර ඇති බව සඳහන් කර ඇත. එම විනය නියෝගයට එරෙහිව අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඔහුගේ 2022.02.27 දිනැතිව ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මගින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනය මගින් ඔහු ඉල්ලා ඇත්තේ, ඔහු වෙත

පනවන ලද ඉහත සඳහන් විනය නියෝගය අහෝසි කර, ඉදිරිපත් කර ඇති චෝදනා වලින් නිදොස් කර, නිවැරදිකරු කරන ලෙසයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් යවන ලද 2019.02.22 දිනැති ලිපිය මගින් අභියාචකට එරෙහිව චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත. එහි චෝදනා 05ක් සඳහන් වේ. එම චෝදනා 05 සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇත. විනය පරීක්ෂණය පැවැත්වූ පරීක්ෂණ නිලධාරියා විසින් චූදිත අභියාචක පළවන චෝදනාවෙන් නිදහස් කරමින් සඳහන් කර ඇත්තේ, එකී චෝදනාවේ සඳහන් පදනම, බිඳ වැටී ඇති බවත්, ඒ අනුව එකී පළවන චෝදනාව සනාථ වී නොමැති බවත්ය. ඉදිරිපත් කර තිබූ 2, 3, 4, සහ 5 යන චෝදනා සනාථ වී ඇති බවට ඔහු විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කර ඇත. එකී තීරණය අනුව යමින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභියාචකගේ වැටුප් වර්ධක 5ක් විලම්භනය කරමින් විනය නියෝගයක් පනවා ඇත.

දෙවන චෝදනාව පදනම් කර ගෙන ඇත්තේ, අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය මගින් 2009.03.20 දිනැතිව ලබා දී ඇති නෙරපීමේ නියෝගය නොසළකා හරිමින් සහ ප්‍රශ්නගත ඉඩම එච්.ඒ.ජානක පෙරේරා යන අය සංවර්ධනය කරමින් සිට ඇති බවට සඳහන් කරමින්, එකී ඉඩම ඔහු වෙත ලබා දීමට තීරණය කර තිබීම යන කරුණුය.

තුන්වන චෝදනාව ඉහත කී දෙවන චෝදනාව මත රැඳී පැවති ඇති අතර, එකී චෝදනාවෙන් චෝදනා කර ඇත්තේ ඉහත කී ජානක පෙරේරා යන අයට මෙම ඉඩමේ දෙමහල් නිවසක් ඉදිකිරීමට ඉඩකඩ සළසා දීමයි.

හතරවන චෝදනාවට පදනම් කර ගෙන ඇත්තේ ඉහත කී මහේස්ත්‍රාත් අධිකරණ නියෝගය තිබියදී, එම ඉඩම් කොටස සඳහා දීර්ඝ කාලීන බදුකරයක් සකස් කිරීමට අභියාචක කටයුතු කර තිබීමයි.

පස්වන චෝදනාව ඉහත සඳහන් කරන ලද චෝදනා හේතුවෙන් අභියාචක ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදය අනුව කියවෙන එහි සඳහන් පළමුවන උපලේඛනයේ අංක 10 වගන්තිය යටතට වැටෙන වරදක් සිදුකළාය යන්නය.

ඉහත කී චෝදනා අනුව පෙනී යන්නේ, අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකණය විසින් නියම කර ඇති නෙරපීමේ නියෝගයක් තිබියදීත්, ප්‍රශ්නගත ඉඩම ජානක පෙරේරා යන අය නමින් බදු ඔප්පුවක් සකස් කිරීමට ඉඩදෙමින්, අභියාචක විසින් කටයුතු කිරීම යන කරුණු පදනම් කරගෙන, අභියෝගයට ලක්කර ඇති නියෝගය නිකුත් කර තිබීමයි.

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයෙහි හෝ මෙම විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද කරුණු වලින් හෝ, අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2009.03.20 දිනැතිව ලබා දී ඇති, ජානක පෙරේරා යන අය ප්‍රශ්නගත ඉඩමෙන් නෙරපීමේ නියෝගයක් නිකුත් කර තිබීම පාර්ශවකරුවන් ප්‍රතික්ෂේප කර නැත. ඒ අනුව ජානක පෙරේරා යන අය ප්‍රශ්නත ඉඩමෙන් ඉවත් කිරීම සඳහා, රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනතේ විධිවිධාන අනුව 2009.03.20 දිනැතිව නියෝගය නිකුත් කර ඇති බව විවාදයෙන් තොරව පිළිගෙන ඇත.

මෙවැනි තත්ත්වයක් යටතේ එම නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික පියවර ගනු ලැබිය යුතු වන්නේ අදාළ ඉඩම අයත් වන ප්‍රදේශයේ ප්‍රාදේශිය ලේකම්වරයා විසිනි. විධිමත් විනය පරීක්ෂණයේදී ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව පැහැදිලි වන්නේ, මෙම දිනය වන විට මෙම ඉඩම අයත් ප්‍රදේශයේ පරිපාලන කටයුතු කරගෙන යනු ලැබුවේ මධ්‍යම නුවරගම් පළාතේ ප්‍රාදේශිය ලේකම්වරයා යටතේ බවයි. එවකට එම කාර්යාලයේ

ප්‍රාදේශිය ලේකම්වරයා ලෙස කටයුතු කර තිබුණේ යූ.ආර්.ටී.රොද්‍රිගු අබේවර්ධන යන අයයි. නමුත් ඇය මෙම තනතුරෙහි සේවය කර තිබුණේ 2009.04.06 වෙනි දින දක්වා පමණි. මෙම දින එනම් 2009.04.06 වෙනි දින සිට, මධ්‍යම නුවර ගම් පළාතේ ප්‍රාදේශය ලේකම් ලෙස රාජකාරී කටයුතු කර ඇත්තේ පී.ඒ.කිත්සිරි යන අභියාචක විසිනි.

ඉහත කී අධිකරණ නියෝගය අනුව කටයුතු කිරීමේ දී ඒ සඳහා ගතයුතු ප්‍රථම කාර්ය වන්නේ, මහේස්ත්‍රාත් අධිකරණයේ පිස්කල් වෙත ඉල්ලීමක් කරමින්, ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමයි. ස්ථානමාරුවක් ලබා සිටි අබේවර්ධන යන අය, මෙම කෙටි කාලසීමාව තුළ එම ඉල්ලීම නොකර තිබීම බලවත් වරදක් ලෙස සැළකිය නොහැකිය. නමුත් 2009.04.06 දින සිට ප්‍රාදේශිය ලේකම් ලෙස කටයුතු කළ අභියාචක, එම වගකීම භාරගනිමින් ඒ සඳහා පියවර ගත යුතුව තිබුණි. එහෙත් ඔහු විසින් එම පියවර, එනම් අධිකරණ නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පිස්කල්වරයා වෙත ඉල්ලීමක් කර තිබීම, මගහැර තිබුණි.

එම ක්‍රියාව වෙනුවට අභියාචක විසින් 2009.04.12 වෙනි දින එනම් අභියාචක මෙම තනතුරේ වැඩ ආරම්භ කළ දින සිට දින 06ක කෙටි කාලයක් ගතවීමෙන් අනතුරුව පළාත් ඉඩම් කොමසාරිස්වෙත ලිපියක් යවමින්, ජානක පෙරේරා යන අය මෙම ස්ථානයෙන් නෙරපීම සඳහා ඉල්ලීමක් කර ඇති බවට දැනුම් දී ඇත. ඉන් අනතුරුව අනුරාධපුර අතිරේක දිසාපති විසින් අභියාචක වෙත යවන ලද 2009.12.23 දිනැති ලිපිය මගින් දන්වා තිබුනේ, ඉන්ද්‍ර ලංකා පත්මසිලි යන අය විසින් කරන ලද ඉල්ලීමක් හේතුවෙන්, මෙම ඉඩමට අදාළ බලපත්‍රය සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා, එකී ලියුම්කරුට අසාධාරණයක් නොවන සේ එම ගැටළුව විසදීමට කටයුත කරන ලෙසයි. එකී කටයුතු ඒ ආකාරයෙන් පැවතියදී

2010.01.25 දිනැති ලිපිය මගින්, උතුරුමැද පළාතේ පළාත් ඉඩම් කොමසාරිස් විසින් අභියාචක වෙත දන්වා ඇත්තේ ඉඩමේ පදිංචිව සිටින අය සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසයි.

ඉහත කී නියෝගය නිකුත් කිරීමේ දී, උතුරුමැද පළාත් ඉඩම් කොමසාරිස් මෙන්ම අභියාචක ද, මේ වන විට අධිකරණය මගින් නිකුත් කර ඇති අධිකරණ නියෝගය ගැන කිසිදු අවධානයක් යොමු කර නොමැති බව පැහැදිලිව පෙනී යයි. එකී අධිකරණ නියෝගය අනුව ඉදිරි කටයුතු කිරීමේ ප්‍රධාන වගකීම පැවරී තිබුනේ අභියාචක වෙතය. මේ සම්බන්ධයෙන් පැවති පරීක්ෂණ වලදී හෝ එම කරුණ ගැන නිසි අවධානයක් යොමු කිරීමට අභියාචක සමත් වී නැත. අභියාචකගේ සහභාගීත්වයෙන් යුක්තව පළාත් ඉඩම් කොමසාරිස්වරයා විසින් ගනු ලැබූ තීරණ ගැනීමේ දී, ඉහත කී අධිකරණ නියෝගය අනුව කටයුතු නොකිරීමෙන් එය අධිකරණයට අපහාස කිරීමක් හැටියට සැළකීමට ද ඉඩකඩ තිබීම කෙරෙහි ද කිසිදු අවධානයක් යොමු කර නැත.

අභියාචකගේ මූලික අදහස වී ඇත්තේ මෙම ස්ථානයේ පදිංචිව පවත්වා ගෙන ගියා යැයි කියනු ලබන ජානක පෙරේරාගේ භුක්තිය සළකා බැලීම මිස, අධිකරණ නියෝගය ක්‍රියාත්මක කර ගැනීම නොවේ.

විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත්ව තිබූ සාක්ෂි අනුව ජානක පෙරේරා යන අයට මෙම ඉඩම් කොටස සම්බන්ධයෙන් රජයේ ඉඩම් බලපත්‍රයක් හිමිව නොතිබිණි. ඉඩම සඳහා ප්‍රථම ඉඩම් බලපත්‍රය නිකුත් කර තිබුණේ මුංමුල්ලගේ ප්‍රියංකා නැමති අයට ය. එකී බලපත්‍රය මත ලද ඉඩමේ අයිතිය මුංමුල්ලගේ ප්‍රියංකා විසින්, පද්මසීලි යන ඇයගේ ඥාති සොහොයුරියකට පවරා දී ඇත. පද්මසීලි යන අය විධිමත් විනය පරීක්ෂණයේ දී පවසා සිටියේ ඇය 2005 වසරේ සිට විදේශගතව සිට ආපසු,

ඉඩමේ භුක්තිය ලබා ගැනීමට පැමිණි විට ජානක පෙරේරා යන අය එයට විරුද්ධ වූ බවත්, ඒ අවස්ථාවේ දී ඇයට පහර දී පැන්නූ බවත් ය. ඒ අනුව ඇය ග්‍රාම නිලධාරීට හා පොලීසියට පැමිණිලි කළ බවට ද සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත. විධිමත් විනය පරීක්ෂණයේ දී සාක්ෂි දී ඇති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විමර්ශන සහකාර නිලධාරී චමින්ද රෝෂණ නැමැති අය ප්‍රකාශ කර ඇත්තේ, අධිකරණ නෙරපීමේ නියෝගයක් ලද අයෙකුට එම ඉඩමේ ස්ථිර දෙමහල් නිවසක් ඉදිකිරීමට ඉඩකඩ ලැබෙන පරිදි කටයුතු කිරීම වරදක් බවයි. එයින් පෙනී යන්නේ අධිකරණ නියෝගය නිකුත් කරන අවස්ථාව වන විට මෙම ස්ථානයේ නිවසක් නොතිබූ බවයි. මෙම තත්ත්ව යටතේ පෙනී යන්නේ අභියාචකගේ ක්‍රියාකලාපය හේතුවෙන්, අධිකරණය මගින් ජානක පෙරේරාට එරෙහිව එම ඉඩමෙන් නෙරපීම සඳහා අධිකරණ නියෝගයක් තිබියදීත්, ඔහු විසින් ඉදිකිරීම් කටයුතු කර ඇති බවයි.

ඉහත කරුණු අනුව පැහැදිලි වන්නේ, අභියාචක විසින් පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුදැනුම සහ/හෝ සහයෝගය අනුව කටයුතු කිරීම නිසා, නිකුත් කර තිබූ අධිකරණ නියෝගයක් ක්‍රියාත්මක කිරීම හිතාමතාම මඟ හැර ඇති බවයි.

එවැනි තත්ත්වයක් යටතේ ඉදිරිපත් කර තිබූ චෝදනා වලට අභියාචක වැරදිකරු කර තිබීමේ දෝෂයක් පෙනේනට නැත.

ඉහත කී තීරණයට එළඹීමේ දී ඊට ඉහතින් සඳහන් හේතුන් පමණක් පාදක කර ගත්තත්, මෙහිදී සඳහන් කළ යුතු තවත් කරුණක් වන්නේ, විනය පරීක්ෂණය අවසානයේදී අභියාචක වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන සමඟ ඇමුණුම් 1 වශයෙන් අමුණා ඇති **2021.04.27** දිනැති ලේඛනයේ සඳහන් කරුණු ය. එම ලිපිය රාජ්‍ය සේවා කොමිෂන්

සභාවේ ලේකම් විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද ලිපියකි. අභියාචක විසින්ම ඉදිරිපත් කර ඇති එම ලිපියේ සඳහන් වන්නේ, අභියාචක විසින් ඔහුගේ වයස සම්පූර්ණවීම මත විශ්‍රාම ගන්වන ලෙසට ඉල්ලීමක් කර ඇති බවයි. එවැනි ඉල්ලීමක් කිරීමට හේතුවක් සඳහන් නොවේ. කෙසේ වෙතත් එවැනි ඉල්ලීමක් කිරීමෙන් ව්‍යංග ලෙස අභියාචක චෝදනාවන්ට වරදකරු බවට ඔහු විසින් ම පිළිගෙන ඇතැයි කෙනෙකුට තර්ක කළ හැකිය. කෙසේ වෙතත් මෙහිදී සඳහන් කළයුතු වන්නේ, විනිශ්චය අධිකාරය විසින් ඉහත තීරණයන්ට එළඹීමේ දී එම කරුණ මත ක්‍රියාකර නොමැති බවයි.

තවද විධිමත් විනය පරීක්ෂණයේ දී අභියාචක සාක්ෂි දී තිබුනේ නම්, ඔහුගේ නිර්දෝෂී භාවය වඩාත් හොඳින් පැහැදිලි කර ගැනීමට හැකියාව තිබුණි. ඔහු සාක්ෂි නොදී සිටීම මත කිසියම් තීරණයකට එළඹුනේ නැතත්, එයද සැළකිල්ලට භාජනය කිරීම විනය නියෝගයක් නිකුත් කිරීමේ දී බාධාවක් වන්නේ නැත.

පැමිණිල්ල විසින් ඉදිරිපත් කර තිබූ සාක්ෂි මතම පමණක් සළකා බලමින්, අභියාචකට එරෙහිව ඇති චෝදනා ඔප්පු වී ඇති බව පැහැදිලිව පෙනී යන අතර, මෙවැනි අවස්ථාව දි අධිකරණයක චෝදනා ඔප්පු කිරීමේ අවශ්‍ය තරමේ බලවත් ඔප්පු කිරීමේ භාරයක් තිබිය යුතු නැති බවටද විනිශ්චය අධිකාරයේ මතයයි.

ඉහත සඳහන් කරුණු සළකා බලා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, විනය පරීක්ෂණයේ දි ගත් තීරණය මත ක්‍රියා කරමින්, අභියාචක වෙත පනවා ඇති විනය නියෝගය ඒ අකාරයෙන්ම පැවතිය යුතු බවට තීරණය කරමු.

ඉහත කරුණු අනුව අභියාචක ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි

(සභාපති)

මම එකඟ වෙමි

(ජේ.ජේ.රත්නසිරි)

(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)

(සාමාජික)

ලලිතා/-